State Government Victoria
Department of Education and Early Childhood Development

# විශේෂ ආගමික උපදෙස් - දෙමාපියන් විසින් කැමැත්ත දීමේ ආකෘතිය (CFFMD141)

**පාසැලේ නම:** | **ආකෘතිය නිකුත් කල දිනය:**

**මෙම පෝරමය පහත වසරවල සිසුන් සඳහාවේ:** | **පහත දිනට පෙර නැවත එවන්න:**

මෙම පෝරමය මගින් සිය දරුවා/දරුවන්ව විශේෂ ආගමික උපදෙස් (Special Religious Instruction (SRI)) සම්බන්ධ වැඩසටහන්වලට ඇතුලත් කිරීමට අදහස් කරන්නේද යන්න දැක්වීමට දෙමාපියන් හට අවස්ථාවක් ලබාදේ. පෝරමය නැවත එවා පාසැල මගින් ඇගයීමකට ලක්කල පසු විදුහල්පතිතුමා විසින් සිය පාසැලේ SRI වැඩසටහන ඇතුලත් කරන්නේද යන්න තීරණය කරනු ඇත.

**විශේෂ ආගමික උපදෙස් ස්වේච්ඡා සේවකයන් පහත ආගම/ආගම්වලින් උපදෙස් ලබාදෙන බව පාසැල වෙත දැනුම්දී ඇත:**

| **ආගම** | **ඒජන්සිය/ලබාදෙන අය** | **වැඩිදුර විස්තර** (ස්වේච්ඡා සේවකයාගේ නම, ආගමික සම්බන්ධතාවය, මූලිකත්වය ගන්නා පල්ලිය) | සතියකට, සති දෙකකට/ මාසයකට **මිනිත්තු/පැය ගණන** | **වැඩසටහනේ කාලය** (උදා: එක මාසයක්, 2 වන වාරය හෝ වසරක්) | **බලාපොරොත්තුවන උපරිම මුදල** |
|---|---|---|---|---|---|
| | - | | | | |
| | | | | | |
| | - | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

මෙම පෝරමය නිකුත් කරන අවස්ථාවේදී එක් එක් ස්වේච්ඡා සේවකයන් සම්බන්ධ තොරතුරු (ඔවුන්ගේ නම්, අනුමත කරන සේවා සපයන්නා සහ ආගමික සංවිධානය) නොමැති අවස්ථාවක පාසැලේ පුවත් ලිපිය හෝ විදුහල්පතිවරයා විසින් නම් කරන ලද වෙනත් ආකාරයකට එම තොරතුරු වැඩසටහන ආරම්භ කිරීමට පෙර දෙමාපියන් හට ලබාදෙනු ඇත. මෙම තොරතුරු ලැබීමෙන් අනතුරුව දෙමාපියන් හට අවශ්‍ය නම්, සිය දරුවා/දරුවන්ව SRI වෙතින් ඉවත් කර ගත හැකිය. පාසැලේ විදුහල්පතිවරයාට ලියා දැන්වීම මගින් ඕනෑම අවස්ථාවක සිය දරුවා/දරුවන්ව SRI වෙතින් ඉවත් කර ගත හැකිය.

2 වන පිටුවෙහි සඳහන් SRI සම්බන්ධ මාපිය කැමැත්ත දීමේ තොරතුරු මා විසින් කියවා අවබෝධකරගත් බව **මම විසින් සනාථ කරමි.** ☐ (කරුණාකර සළකුණු කරන්න)

පාසැලේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කලහොත් ඔබගේ දරුවා/දරුවන් හට SRI සඳහා සහභාගිවීමට **ඔබ කැමැත්ත ලබාදෙන්නේද?**

**ඔව්** ☐
**නැත** ☐
(කරුණාකර එකක් සළකුණු කරන්න)

ඔබ ඔව් යනුවෙන් සළකුණු කලහොත්, කරුණාකර ඔබගේ දරුවා/දරුවන්ගේ නම් සඳහන් කරන්න:

| **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ වාසගම** | **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ මුල් නම** | **වසර** | **ඉහත ආගම්වලින් SRI සහභාගිත්වයට කැමැත්ත ලබාදෙන්නේ කුමන ආගමක් සඳහාද?** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

SRI වැඩසටහනට සහභාගිවීම සඳහා අවශ්‍ය දේ මිලට ගැනීමට මුදලක් වැයවන බව සහ පාසැලේ SRI පවත්වන බවට තීරණයක් ගත් පසු මෙම මුදල එකතු කරනු ඇති බව **මම අවබෝධ කරගෙන සිටිමි.** ☐ (කරුණාකර සළකුණු කරන්න)

**දෙමාපිය/භාරකරුගේ නම:** ..............................................................................................................

**ලිපිනය:** ..............................................................................................................

**අත්සන:** .............................................................................. **දිනය:** ............/............/.............

ඔබගේ දරුවා/දරුවන් SRI වැඩසටහනට සහභාගි කරවීමට ඔබ කැමතිනම්, ඔව් යනුවෙන් සළකුණු කර නියමිත දිනට පෙර පාසැල වෙත මෙම පෝරමය නැවත යවන්න. *ඔබ මෙම පෝරමය නැවත පාසැල වෙත යැවුයේ නැතිනම්, පාසැලේ SRI පැවැත්වීමට තීරණය කලද ඔබගේ දරුවාව මෙම වැඩසටහනට ඔබ සහභාගි කිරීමට කැමැත්ත ලබා නොදෙන බවට මෙයින් හැඟවේ.*

අධ්‍යාපන සහ බාල ළමාවිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශේෂ ආගමික උපදේශ ප්‍රතිපත්තිය සඳහා ප්‍රවේශ විය හැක්කෙ
http://www.education.vic.gov.au/school/principals/spag/curriculum/pages/religious.aspx

# විශේෂ ආගමික උපදෙස් - දෙමාපිය කැමැත්ත දීම සඳහා තොරතුරු

රජයේ පාසැල්වල පල්ලි සහ වෙනත් ආගමික කණ්ඩායම් මගින් ලබාදෙන විශේෂ අධ්‍යාපනික උපදේශ (SRI) සඳහා බලය ලබා දෙන්නේ *2006 අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිසංස්කරණ පනතේ* (*Education and Training Reform Act 2006*) 2.2.11 වගන්තිය යටතේය.

## විශේෂ ආගමික උපදෙස් සම්බන්ධ ප්‍රතිපත්තිය

SRI ලබාදිය හැක්කේ සහ ඉගැන්විය හැක්කේ දෙපාර්තමේන්තු ප්‍රතිපත්තිය සහ විධාන එම්.ඩී.141 අනුව පමණි. SRI ලබාදිය හැක්කේ ප්‍රතීක සහ අනුමත කල ස්වේච්ඡා ආගමික උපදේශකයෙකු (උපදේශකයන්) පාසැලකට පැමිණ නීති අවශ්‍යතා අනුව කටයුතු කිරීමට අවශ්‍ය සම්පත් පාසැලේ ඇති අවස්ථාවක සහ SRI පැවැත්වෙන අවස්ථාවලදී සිසුන් සම්බන්ධ සැලකිලිමත්වීමේ යුතුකම ඉටුකල හැකි බවට වගබලාගත හැකි අවස්ථාවල පමණි.

පාසැල් මගින් දෙමාපියන් හට මෙම පෝරමය ලබා දෙන්නේ ප්‍රතීක ලත් සහ අනුමැතිය ලත් SRI ස්වේච්ඡා සේවකයෙකු පාසැල වෙත පැමිණියහොත් පමණි. ආකෘතිය දෙමාපියන් හට ලබාදී, සම්පූර්ණ කල ආකෘතිය පාසැල වෙත ලබාදුන් පසු පාසැලෙහි SRI වැඩසටහන ලබාදීමට ප්‍රමාණවත් සම්පත් ඇතිද යන්න විදුහල්පතිවරයා විසින් තීරණය කරනු ඇත.

**MD 141 සහ ප්‍රතිපත්තිය මාර්ගගතව ලබාගත හැකිය** http://www.education.vic.gov.au/about/department/legislation/Pages/sri.aspx
http://www.education.vic.gov.au/school/principals/spag/curriculum/pages/religious.aspx

## විශේෂ ආගමික උපදෙස් යනු කුමක්ද?

SRI යනු විශේෂිත ආගමික විශ්වාසයන් සහ ආගමක මූලික මූලධර්මවලට අදාල උපදෙස් වන අතර සාමාන්‍ය ආගමික අධ්‍යාපනය (General Religious Education (GRE)) සමග පටලවා ගත යුතු නැත. GRE යනු ආගම් සම්බන්ධ අධ්‍යාපනය වන අතර (සිය ආගම ක්‍රියාත්මක වන ආකාරය සහ විශ්වාසයේ ව්‍යුහය පැහැදිලි කරදීමට යම් විශේෂිත විශ්වාසයක නියෝජිතයන් උපකාර කර ගැනීම හෝ නොගැනීම ඇතුලත් විය හැකිය), SRI වැඩසටහන් මගින් නියමිත ආගමක උපදේශ ලබාදීම සිදුවන අතර එවා අතර ආගමික ග්‍රන්ථයන් පිළිබඳ ඉගෙනීම, සහ යම් විශේෂිත විශ්වාසයක ආගමික මූලධර්මයන්ට අනුව කෙසේ ජීවත්විය යුතුද සහ හැසිරිය යුතුද යන්න ඇතුලත්වේ.

SRI මගින් සියළුම විශ්වාසයන් සහ ආගම් සම්බන්ධ සමස්ථ ඇගයීමක් ලබා නොදේ. එක් එක් SRI වැඩසටහන මගින් උපදෙස් ලබාදෙන්නේ එම විශ්වාසයස සම්බන්ධයෙන් පමණි. මේවා ලබාදෙන්නේ අදාල පල්ලිය හෝ වෙනත් ආගමික කණ්ඩායම මගිනි. SRI වැඩසටහනේ ආගමික ස්වරූපය හේතුවෙන් අධ්‍යාපන සහ බාල ළමාවිය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් බලයලත් ස්වේච්ඡා උපදේශකයන් මගින් ලබාදෙන වැඩසටහනේ අඩංගු දෙය අනුමත කිරීම සිදු නොකරයි.

## විශේෂ ආගමික උපදෙස් ලබා දෙන්නේ කා විසින්ද?

පාසැල් හට ලබාදෙන විශේෂ ආගමික උපදෙස් ක්‍රිස්තියානි ආගම, කතෝලික ආගම, ඕතඩොක්ස් ක්‍රිස්තියානි ආගම, යුදෙව් ආගම, බෞද්ධ ආගම, හින්දු ආගම, ඉස්ලාම් ආගම, බහායි සහ සික් ආගම ඇතුළු විවිධ ආගම් වලින් ලබාගත හැකිය. පාසැල් හට ලබාගත හැකි ආගම තීරණය වන්නේ යම් පාසැලක් වෙත උපදේශකයන් පැමිණියේද යන්න මතය. දැනට ස්වේච්ඡා විශේෂ ආගමික උපදේශකයන් හට බලය ලබාදෙන සේවා සපයන්නන් වන්නේ:

| **ආගම** | **ඒජන්සිය / සපයන අය** | **වැඩිදුර විස්තර සඳහා සපයන අයගේ වෙබ් අඩවිය බලන්න** | **සපයන අයගේ දුරකථන අංකය** |
|---|---|---|---|
| ක්‍රිස්තියානි ආගම | ඇක්සෙස් මිනිස්ට්‍රීස් (ACCESS Ministries) | http://www.accessministries.org.au/ | 1800 063 341 |
| කතෝලික ආගම | කතෝලික අධ්‍යාපන කාර්යාලය (Catholic Education Office) | http://www.ceomelb.catholic.edu.au/ | 9267 0228 |
| ඉස්ලාම් ආගම | ආර්කන් ටොලීඩෝ (Arkan Toledo) / වික්ටෝරියාවේ ඉස්ලාම් කවුන්සිලය (Islamic Council of Victoria) | http://arkan.org.au/ | 1300 857 797 |
| යුදෙව් ආගම | එක්සත් යුදෙව් අධ්‍යාපන මණ්ඩලය (United Jewish Educational Board) | http://www.ujeb.org.au/ | 9038 5028 |
| බෞද්ධ ආගම | **ඕස්ට්‍රේලියාවේ සාමය සම්බන්ධ ආගම් (Religions for Peace Australia (RfP))** | http://religionsforpeaceaustralia.org.au/ | |
| ඕතඩොක්ස් ක්‍රිස්තියානි ආගම | | | |
| බහායි විශ්වාසය | | | |
| සික් ආගම | | | |
| හින්දු ආගම | | | |

ස්වේච්ඡා උපදේශකයන් පල්ලියක් හෝ ආගමික සංවිධානයක් සමග සම්බන්ධතාවයක් ඇත. ඔවුන්ගේ කාර්යය ගුරුවරයෙකුගේ කාර්ය නොවේ. බලය ලබාගැනීම සඳහා ඉහතින් සඳහන් කල සේවා සපයන්නන් එකකින් පුහුණුව ලබාගත යුතුය. එසේම ඔවුන් රජයේ පාසැලක කෙසේ හැසිරිය යුතුද යන්න දැක්වෙන හැසිරීම් සංග්‍රහයකට අත්සන් කල යුතුය. බලය ලබාගැනීම සඳහා අවශ්‍යතාවයක් වන්නේ ස්වේච්ඡා සේවකයන් දරුවන් සමග කටයුතු කිරීම සඳහාවූ වලංගු පරීක්ෂාවක් (Working With Children Check) ලබාගෙන තිබීමවේ.

## විශේෂ ආගමික උපදෙස් සඳහා සහභාගීවීම

විශේෂ ආගමික උපදෙස් සඳහා සහභාගිවීම ස්වේච්ඡාවෙන්වේ. දරුවන් හට SRI වැඩසටහනට සහභාගිවීමට දෙමාපියන් විසින් කැමැත්ත ලබාදී නොමැතිනම්, දරුවන්ව SRI වැඩසටහනට යෙදවිය නොහැක. SRI සම්බන්ධ තොරතුරු මාර්ගගතව හෝ වැඩසටහන ලබාදෙන ඒජන්සිය මගින්ද දෙමාපියන් හට විමර්ශණය කිරීමට ලබාගත හැකිය.

පාසැලේ SRI ලබාදෙන්නේ නම්, සිය දරුවා වැඩසටහනට සහභාගි කරවීමට බලාපොරොත්තු වන්නේ නම්, අදාල ආකෘතිය සම්පූර්ණ කර පාසැල වෙත ලබාදෙන ලෙස දෙමාපියන්ගෙන් ඉල්ලා සිටී. මෙම ආකෘතිය පාසල වෙත නැවත ලබා නොදුනහොත්, SRI වැඩසටහන පාසැලේ ලබාදුන්නද, ඔබගේ දරුවා එයට සහභාගි නොවනු ඇත. SRI වැඩසටහනට සහභාගි නොවන ශිෂ්‍යාවන් මූලික විෂය මාලාවෙන් බාහිර අධාපනිකව වැදගත්වන වටිනා ක්‍රියාකාරකම්වලට සහභාගිවනු ඇත. මෙය සිදුවන්නේ SRI වැඩසටහනට සහභාගිවන ශිෂ්‍යාවන් සිටින පංති කාමරවලට වඩා වෙනස් පංති කාමරවලය.

**පාසැලේ විදුහල්පතිවරයාට ලිඛිතව දැනුම්දීම මගින් ඕනෑම අවස්ථාවක ඔබගේ දරුවා / දරුවන්ව විශේෂ ආගමික උපදෙස් මගින් ඉල්ලා අස්කර ගත හැකිය.**

## වැඩිදුර විස්තර

MD141 සහ දෙපාර්තමේන්තු ප්‍රතිපත්තිය සඳහා ප්‍රවේශ විය හැක්කේ http://www.education.vic.gov.au/about/department/legislation/Pages/sri.aspx
http://www.education.vic.gov.au/school/principals/spag/curriculum/pages/religious.aspx